•

# චන්ද්‍ර හා සූර්ය ගණයේ ඖෂධ භාවිත කර සිදුකරනු ලබන පාරම්පරික කැඩුම් බිඳුම් වෙදකම

පාරම්පරික වෛද්‍ය ආරියදාස චන්ද්‍රසේන මාකලන්ද

කැඩුම් බිඳුම් වෙදකමේ අස්ථි තැලීම්, පේන්දුව, උළුක්කුව වැනි රෝග අවස්ථා ද සන්ධි පැනීම ද හමුවේ. අස්ථි බිඳීම ද හමුවේ. අස්ථි කැඩීම යනු අස්ථියක් දෙකට කැඩීම හෝ ලොකු කැබලි වලට කැඩීමෙනි. අස්ථි බිඳීම යනු පිපිරීම සහිත ව අස්ථිය කුඩා කැබලි වලට කැඩීම වේ. තැලීම් යනු මාංස හා පටක තැලීමට ලක්වීමයි. පේන්දුව යනු කැඩීම් බිඳීම් වලට පසුව සිදුවන කල් අල්ලා සිටින ඉදිමුමයි. උළුක්කුව යනු පේශි සහ ඇටකටු ලිස්සායාම, කෙටීම්, එකට එකක් වැදීම, නහර පෙරලීම යනාදියයි. සන්ධි පැනීම යනු සන්ධි කිහිපයක් සවිවන ස්ථානයෙන් ගිලිහීමයි.

## ඉතිහාසය

හන්දි වෙදකම පුලතිසි, රාවණා යුගයේ සිට පැවත එන පැරණි ම වෙදකමකි. මිනිසා විවිධ ක්‍රියාකාරකම් වල නිරත වීමේ දී වැටීම් තැලීම් වලට ලක් වේ. එවිට ඒ සඳහා ස්වාභාවික ශාකමය කොටස් යොදා ගනිමින් ප්‍රතිකාර කෙරිනි. එනම් විවිධ ඖෂධ යෝග, පත්තු, මැල්ලුම්, තෛල සාදා භාවිත කරන ලදී.

ප්‍රතිකාර කිරීමේ දී පළමුව රෝගියාට කම්පනය ඇති වී ඇත්දැයි බලයි. එයින් රෝගියා මිය යන්නට වුවද පුළුවන. මුඛ නාසා ආදියෙහි රුදි මඩ, පස් ආදිය ඉවත්කර රුධිර වහනය වීම් ඇතිනම් නතර කල යුතුයි. පසුව පරීක්ෂා කර බලා අස්ථි කැඩීමක් ද බිඳීමක් ද යන්න හඳුනා ගත යුතුයි. මෙහිදී පළමුව තුවාලය සුවකර පසුව කැඩීමට බිඳීමට ප්‍රතිකාර කල යුතුයි. එක් එක් කැඩීම් බිඳීම් සඳහා වෙන වෙන ම ප්‍රතිකාර ඇත. විශාල කැඩුම් බිඳුම් හානි සිදු වූ විට න්‍යග්‍රෝධ ගණයේ නොහොත් සූර්ය ගණයේ බෙහෙත් බඳියි. ( නුග, බෙර, මාදං වැනි) සන්ධි පැන ඇති විට චන්ද්‍ර ගණයේ බෙහෙත් බඳියි. චන්ද්‍ර ගණයේ ඖෂධ සෞම්‍යයි. ( කොටදිඹුලා , බෝඹුපොතු , කෝමාරිකා වැනි ඖෂධ) මෙම ඖෂධ වලින් සෑදූ පත්තු මැල්ලුම්, තෛල ආදිය භාවිත කරයි. විශේෂයෙන් වේදනාව සමනයට තෙල් වර්ග ආලේප කරයි. එළඟිතෙල් වේදනාව නසනවා මෙන්ම තුවාල පැසවීම ද වළකාලයි.

## රෝගය හඳුනා ගැනීම

පළමුව අත්දැකීම් ඇසුරෙන් කුමන වර්ගයේ භග්නයක්දැයි හඳුනා ගත යුතුය. ඒ අනුව පෙර ප්‍රතිකාර කල පුරුද්ද අනුව ප්‍රතිකාර යොදයි. තමා විසින් ම කිරීමෙන් ලබාගත් පළපුරුද්ද ඉතා වැදගත්ය. නිසි ප්‍රතිකාර නොලැබුනොත් තුවාල ඔඩු දුවයි. එසේම  භග්නය නිසි පරිදි සකස් කිරීම වඩා වැදගත් වේ. කැඩුම් බිඳුම් වෙදකම පිළිබඳ ව ඉතා සරල ව ඉහත පරිදි විස්තර කල හැකි අතර මෙම දැනුම පාරම්පරික ව පැවත එන්නකි. අපගේ මෙම පාරම්පරික කැඩුම් බිඳුම් වෙදකම පළමු වෙදැදුරා වන බත්තරමුල්ලේ ශ්‍රී සුභූති හිමිගෙන් මාකලන්ද පරපුරට තිළිණ වූ අතර  ඉන්පසුව ඒ.එස්.මුතුණ්ඩා වෛද්‍යතුමාගෙන් ද වෙදකම හදාරා මා විසින් 1968 සිට කැඩුම් බිඳුම් වෙදකම සිදු කර ගෙන යයි. මා වසරකට රෝගීන් 350-400ක් සුවපත් කරන අතර මාගේ පුත්‍රයන් දෙදෙනකු ට ද මෙම ශාස්ත්‍රය ලබාදීමට කටයුතු කර ඇත.